# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,480 - 2007 ජනවාරි 12 වැනි සිකුරාදා - 2007.01.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 26 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 26 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 27 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජනවාරි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජනවාරි මස 05 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

### නුගේගොඩ කොට්ඨාශයේ මිරිහාන දිසා බඩු ගබඩාවේ අබලි භාණ්ඩ වෙන්දේසිය

නුගේගොඩ කොට්ඨාශයේ, පොලිස් ස්ථානවල පාවිච්චි කරන ලද දැනට පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් අබලි භාණ්ඩ 2007.01.20 වන දින පෙරවරු 10.00 ට මිරිහාන පොලිස් ක්‍රීඩා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එසේ වෙන්දේසිවන භාණ්ඩ ගැනුම්කරුවන් විසින් මුදල් ගෙවා එවලේම වෙන්දේසිය භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, භාණ්ඩ ලබා ගන්නා ගැනුම්කරුවන් විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. 2007.01.19 දින පැය 1300 සිට ප ැය 1600 දක්වා වෙන්දේසි භූමියේ දී භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

භාණ්ඩ වර්ග

| | | ප්‍රමාණය |
|---|---|---|
| 01. | පාපැදි (ප්ලයින් පිජන්) | 60 |
| 02. | පාපැදි (ඇවෝන්) | 32 |
| 03. | පා පැදි (බුකි) | 05 |
| 04. | පාපැදි (රාජා) | 02 |
| 05. | පාපැදි (ආර්.එම්.අයි.) | 03 |
| 06. | පාපැදි (හන්ටර්) | 01 |
| 07. | පාපැදි (ලුමාලා) | 01 |
| 08. | පාපැදි ( ස්පීඩ්) | 01 |
| 09. | පාපැදි (රෝයල්) | 01 |
| 10. | පාපැදි (ග්‍රෑන්ඩ් චැම්පියන්) | 02 |
| 11. | පාපැදි (රැලේ) | 01 |
| 12. | පාපැදි(ගැසල්) | 01 |
| 13. | පාපැදි (රෝඩ් මාස්ටර්) | 01 |
| 14. | පාපැදි (වර්ගය අපහැදිලි) | 28 |
| 15. | යතුරුලියන සිංහල (ඔප්ටිමා) | 03 |
| 16. | යතුරුලියන සිංහල (ඔලිවෙට්ටි) | 05 |
| 17. | යතුරුලින සිංහල (පැසිස්ට්) | 01 |
| 18. | යතුරුලියන සිංහල ( වර්ගය පැහැදිලි නැති) | 05 |
| 19. | යතුරුලියන ඉංග්‍රීසි (ඔප්ටිමා) | 02 |
| 20. | යතුරුලියන ඉංග්‍රිසි (පැසිස්ට්) | 02 |
| 21. | යතුරුලියන ඉංග්‍රීසි (රෝයල්) | 01 |
| 22. | යතුරුලියන ඉංග්‍රීසි (ඔලිම්පියා) | 01 |
| 23. | යතුරුලියන ඉංග්‍රීසි ( වර්ගය අපැහැදිලි) | 02 |
| 24. | ටී.ටී.මැෂින් (හින්දුස්තාන්) | 02 |
| 25. | යතුරුලියන විදුලි (කැනන්) | 01 |
| 26. | මේස විදුලි පංකා | 01 |
| 27. | සිවිලිං විදුලි පංකා (සුප්‍රිම්) | 01 |
| 28. | සිවිලිං විදුලි පංකා (උෂා) | 02 |
| 29. | සිවිලිං විදුලි පංකා (බ්‍රවුන්ස්) | 01 |
| 30. | සිවිලිං විදුලි පංකා (වර්ගය අපැහැදිලි) | 01 |
| 31. | ඡායා පිටපත් යන්ත්‍ර (කැනන්) | 01 |
| 32. | සිටුවන විදුලිපංකා (වර්ගය අපැහැදිලි) | 01 |
| 33. | වතුර බොයිලේරු | 01 |
| 34. | යකඩ ආරක්ෂක හිස්වැසුම් | 44 |
| 35. | බිත්ති ඔරලෝසු (වෙම්බ්ලි) | 02 |
| 36. | විදුලි කේතල | 03 |
| 37. | වතුර පිල්ටර් | 03 |
| 38. | ලන්තෑරුම් | 03 |
| 39. | බාල්දි | 05 |
| 40. | සාස්පාන් (කල්දේරම්) | 06 |
| 41. | හම් සපත්තු (කට්ටල) | 169 |
| 42. | හම් ඉනපටි | 253 |
| 43. | පැට්‍රෝල් ලාම්පු | 01 |
| 44. | වානේ පුටු කැබලි | 01 |
| 45. | වතුර බෝතල් | 03 |
| 46. | පිහියා | 06 |
| 47. | උදලු තල | 04 |
| 48. | එනමල් කේතල | 01 |
| 49. | ටියුබ් ලයිට් කට්ටල | 08 |
| 50. | මුල්ලු | 01 |
| 51. | රේක්ක | 02 |
| 52. | පාපැදි බෝල | 178 |
| 53. | පා පැදි බ්‍රේක් රෝඩ් | 04 |
| 54. | පා පැදි බ්‍රේන් නට් | 18 |
| 55. | එනමල් ජෝගු | 01 |
| 56. | රූපවාහිනී යන්ත්‍ර ( ජෙනරල්) | 01 |
| 57. | රූපවාහිනී යන්ත්‍ර (ටාටුන්) | 02 |
| 58. | උණ්ඩ උර | 131 |
| 59. | නිළ ඇඳුම් පෙට්ටි | 35 |

කේ. උදයපාල,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
නුගේගොඩ කොට්ඨාශය.

01 – 183

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානියේ, එච්. ඒ. ඕ. 3 අයි. බී මිඩ්ල්සෙක්ස්, උතුරු වෙම්බ්ලි පාස්චර් පාරේ, අංක 9 ස්ථානයේ පදිංචිව සහ දැනට කොළඹ 06, වැල්ලවත්තේ, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවතේ, අංක 53/9හි පදිංචි සින්නතුරේ සිවකඩාචම් වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයේ කොස්වත්තගේ චන්ද්‍රදාස පෙරේරා සහ සමන්ති ශ්‍රෙරෝ යන සාක්ෂිකරුවන් ඉදිරිපිට දී, කොළඹ 06, ඇලෙක්සැන්ඩ්‍රා පාරේ, අංක 25/1 හි පදිංචි සහ දැනට කොළඹ 04, ඩේවිඩ්සන් පාරේ, අංක 62හි පදිංචි තවරාෂා ගෞරී ෂන්ගරි වෙත ප්‍රදානය කරන ලද 1996 මැයි මස 16 වන දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු වී අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

සින්නතුරේ සිවකඩාචම්.

01 – 184

### ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

රාගම, පේරලන්ද ආනියාකන්ද පාර, නො. 123/බී/3/4 පදිංචි දේගිරිගේ ෂෙරීන් ප්‍රීඩා පෙරේරා වන මම 'මිහිර' නො. 186, තොටුපොල පාර, අමන්දොළුව, සීදූව පදිංචි මල්ලවතන්ත්‍රිගේ රුක්මන් කුමාර් පෙරේරා යන අයට ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඒ.ඩී.එච්.ටී. සෙනරත් විසින් 2004.11.24 දින ලියා සහතික කළ අංක 3386 දරන ඔප්පුවෙන් මා විසින් අයිතිය ලැබූ ඉඩම විකිණීම හෝ පැවරීම සඳහා මගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කර ගනිමින් මා විසින් 2006.04.18 දින අත්සන් තබන ලද විදේශීය ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ද බව මෙයින් දන්වා සිටිමි. එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

ඩී. එස්. එෆ්. පෙරේරා,<br>
පේරලන්ද,<br>
රාගම.

01 – 185

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වේයන්ගොඩ, පත්තලගෙදර, ධම්මානන්ද මාවත, අංක 56ඩී හි පදිංචි විජේරත්න ඒකනායක වාසල මුදියාන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩාර වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 වන අධිකාරිය වන නොතාරිස් ආඥා පනතේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ඩබ්. ඊ. ඩබ්. එම්. සෙනෙවිරත්න බණ්ඩාර,

2007 ජනවාරි මස 12 වැනි දින,<br>
56ඩී,<br>
ධම්මානන්ද මාවත,<br>
පත්තලගෙදර,<br>
වේයන්ගොඩ.

01-206

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ඩී. එෆ්. සී. සී. බැංකුව

(පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව) මගින් අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

අංක 343, 400,371 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ, පමුණුගම උපකාර්යාල බල ප්‍රදේශය ඇතුළත දැලතුර නැමති ග්‍රාමයේ පිහිටි හුන්ගන්වැලිකුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද, හැඳින්වෙන හුන්ගන්වෙල සහ වැලිහිඳ නැමැති ඉඩමේ, සර්වෙයර් ජනරාල්වරයා විසින් මැන සාදවන ලද අංක කෝ. 2321 හා 1975.01.23 වන දින පිඹුරේ ලොට් අංක 02 දරන බිම් කට්ටියේ අතුරු බෙදීමක් වන බලය ලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 4254 හා 1995 නොවැම්බර් 18 දින දරන පිඹුරේ ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය. ප්‍රමාණය අ. 3, රූ. 1, පර්. 15 (අක්කර තුනයි රූඩ් එකයි පර්චස් පහළවයි. එහි තුල ඇති ගොඩනැගිලි වැව්ලි සහ වෙනත් දේ සමග වේ.) අංක 878 උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම පත්තුමේ වත්තල ප්‍රාදේශීය සභාවේ, පමුණුගම උපකාර්යාල බල ප්‍රදේශය ඇතුළත දැලතුර නැමති ග්‍රාමයේ පිහිටි හුන්ගන්වැලි කුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද හැඳින්වෙන හුන්ගන්වෙල සහ වැලිහිඳ නැමති ඉඩමේ, සර්වෙයර් ජනරාල්වරයා විසින් මැන සාදවන ලද අංක කෝ. 2321 හා 1975.01.23 වන දින පිඹුරේ ලොට් අංක 02 දරන බිම් කට්ටියේ අතුරු බෙදීමක් වන බලය ලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 4254 හා 1995 නොවැම්බර් 18 දින දරන පිඹුරේ ලොට් අංක 02 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය ප්‍රමාණය අ. 1, රූ. 1 පර්. 17 (අක්කර එකයි රූඩ් එකයි පර්චස් දාහතයි එහි තුල ඇති ගොඩනැගිලි වැවි ලි සහ වෙනත් දේ සමග වේ) වර්ෂ 2000ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින අංක 1163/26 දරන *ගැසට් පත්‍රයේ* සඳහන් රජය විසින් අත්පත් කරගත් කොටස අත්හැර ජා ඇල කේ. ටී. ටී. පෙරේරා මහතා විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද දේපල. ඩී. එෆ්. සී. සී. බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2007ක් වූ ජනවාරි මස 31 වැනි දින පෙ. ව. 11.30ට ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි :

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),<br>
(2) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%).<br>
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),<br>
(4) නොතාරිස් ගාස්තු රු. 2000,<br>
(5) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,<br>
(6) සියළුම ප්‍රචාරක වියදම්,<br>
(7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත්කළ දින සිට දින 30ක් ඇතුලත දී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති නිලධාරී අමතන්න.<br>
දුරකථන අංක 440366<br>
ගාමිණී බී. එස්. දීයාව<br>
වෙන්දේසිකරු, තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු,<br>
247, ප්‍රීතිපුර පාර, පල්ලිය වත්ත, හැඳල, වත්තල.<br>
දුරකථන : 011-2949010, 0777281723

01-210

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0300000923.

ණයකරුගේ සම්පූර්ණ නම : වඩුගේ චන්ද්‍රාවති පෙරේරා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.03.14 වැනි දින අංක 1280 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2007.11.07 වන වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මහතා විසින් 2007.01.30 වැනි දින පෙ. ව. 10.30ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්දෙදහස් දෙසිය අසූ එකයි ශත හැත්තෑ හතරක (රු. 1,32,281.74) මුදලක් වර්ෂ 2002.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූතුන්දහස් හාරසිය හැත්තෑහතරයි ශත තිස් පහක (රු. 93,474.35) මුදල ද, 2002.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්අටදහස් අටසිය හතයි ශත තිස්නවයක් (රු. 38,807.39) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස් දෙදහස් දෙසිය අසූඑකයි ශත හැත්තෑ හතරක් (රු. 1,32,281.74) ද,

(2) එකී රුපියල් අනූතුන්දහස් හාරසිය හැත්තෑහතරයි ශත තිස්පහක (රු. රු. 93,474.35) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ තල්පිටිදෙබැද්ද පත්තුවේ පානදුර නගර සභා සීමාවේ නල්ලුරුව ග්‍රාමයේ මහවිදිය පාරේ වරිපනම් අංක 682 හි පිහිටි හික්ගහවත්ත ලොට් බී *හෙවත්* බුළුගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමට 1986.08.28 දින බී. එල්. ඩී. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 2182 පිඹුර ප්‍රකාර උතුරට : ලොට් ඒ (මෙම ඉඩමද, නැගෙනහිරට : ගාලු පාරද, දකුණට : සයිමන් කුරේට අයිති ලොට් සී ද, බටහිරට : පොකුණේවත්ත *හෙවත්* බෙලිගහවත්ත ද යන මායිම් තුළ පිහිටි එකොළහයි දශම හතරයි තුනක් (අ. 0, රූ. 0, පර්. 11.43) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊටඅයත් සියළුදේද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 289/194 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2006ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-212

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000828.

ණයකරුගේ සම්පූර්ණ නම : අලහකෝන් මුදියන්සේලාගේ වසන්ත කුමාර අලහකෝන්

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.06.02 වැනි දින අංක 1445 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.06.08 වැනි දින "ලක්බිම", "තිනක්කුරල්" " සහ2006.12.27 වන දින "ද අයිලන්ඩ්"පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 83/5, බෝමළුව පාර, වටපුලුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මහතා විසින් 2007.01.31 වැනි දින පෙ. ව. 11.00ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැට දෙදහස් හාරසිය හැත්තෑ දෙකයි ශත හතලිස් දෙකක (රු. 1,62,472.42) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑපන් දහසක (රු. 75,000) මුදල ද, 2002.06.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූහත්දහස් හාරසිය හැත්තෑ දෙකයි ශත හතලිස් දෙකක් (රු. 87,472.42) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැට දෙදහස් හාරසිය හැත්තෑ දෙකයි ශත හතලිස් දෙකක (රු. 1,62,472.42) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000)ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොලියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, නව උඩුදුම්බර නැගෙනහිර ගම්පහ කෝරළේ, මීනුවන්ගොඩ පිහිටි වෙලන්ගහඇලේහේන නමැති ඉඩමට වර්ෂ 1997.02.14 දින කේ. එම්. එච්. නවරත්න මානක මැන සකසන ලද 11122 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට : ජී. ඩබ්. වසන්තගේ ඉඩම වෙන් කරන පැලඉති වැටද, නැගෙනහිරට : ජී. විජේරත්න බණ්ඩාගේ ඉඩම වෙන් කරන පැලඉති වැටද, දකුණට : ඇලද, බස්නාහිරට : මඩුගල්ල සිට කලුන්තැන්න තෙක් දිවෙන පාරද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක (අක්. 0, රු. 2, පර්. 0) වපසරියකින් යුත් ඉඩම සහ ඊට අයත් සියළුදේද නුවර ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ එම්. 15/58 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-213

---

### ශ්‍රී ලංකා නිවාස සංර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000480.

ණයකරුගේ සම්පූර්ණ නම : මෛත්‍රී වඩුගේ ඉන්දික තුෂාර

(මෙහි මින් මතු " බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.10.27 වන දින අංක 1466 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.11.13 වන දින "ලක්බිම", "තිනක්කුරල්", "ද අයිලන්ඩ්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුලුව, මහනුවර ස්ථානයේ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මයා විසින් 2007.01.30 වන දින ප. ව. 2.00 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූපන්දහස් නවසිය තිස් අටයි ශත විසිතුනක (රු.95,938.23) ක මුදලක් වර්ෂ 2004.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූහතර දහස් අටසිය හැට අටයි ශත පනස් පහක (රු. 84,868.55) ක මුදල ද, 2004.10.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් එකොළොස් දහස් හැටනවයයි ශත හැට අටක (රු.11,069.68) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූපන්දහස් නවසිය තිස් අටයි ශත විසිතුනක (රු.95,938.23) ද,

(2) එකී රුපියල් අසූහතර දහස් අටසිය හැට අටයි ශත පනස් පහක (රු. 84,868.55) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොලියක් 2004.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ දකුණු මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහ පල්ලේසියපත්තුවේ නායකුඹුර සහ වත්තේගම්මැද්ද ග්‍රාමයෙහි පිහිටි කුළුපනාවත්ත (දෙහිගහමුලේයාය, ඉරිවේලියායේ කොටසක් සහ නවවෙල්ගොල්ලේයාය, වැවේයායහේන, උඩගෙදරහේන, වැවේයාය, හංගිලිගෙදරහේන ඒකාබද්ධ කරන ලද) නමැති ඉඩමට 1997.02.27 දින ඩී. වීරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3683 පිඹුර ප්‍රකාර ලොට් 101 ට මායිම් උතුරට : කැබලි අංක235 (පාර) ද, නැගෙනහිරට : කැබලි අංක 100 ද, දකුණට : කැබලි අංක106 (පාර) ද, බටහිරට : කැබලි අංක102 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අක්. 0, රු. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 415/267 හි ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී වත්තෙගම්මැද්ද ග්‍රාමයෙහි පිහිටි කුළුපනාවත්ත (දෙහිගහමුලේයාය, ඉරිවේලියායේ කොටසක් සහ නවවෙල්ගොල්ලේයාය, වැවේයායහේන, උඩගෙදරහේන,වැවේයාය, හංගිලිගෙදරහේන ඒකාබද්ධ කරන ලද) නැමැති ඉඩමට 1997.02.27 දින ඩී. වීරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3683 පිඹුර ප්‍රකාර ලොට් 102 ට මායිම් උතුරට : කැබලි අංක 235 (පාර) ද, නැගෙනහිරට : කැබලි අංක 101 ද, දකුණට : කැබලිඅංක106 (පාර) ද, බටහිරට : කැබලි අංක 103 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අක් .0, රු. 0, පර්. 15) ක වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවයද සමහ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 415/268 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 28 වන දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

01-214

## ශ්‍රී ලංකා නිවාස සංර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000742

ණයකරුගේ සම්පූර්ණ නම : විජේසිංහ මුදියන්සේලාගේ දිනූෂ දේශප්‍රිය ධර්මරත්න

(මෙහි මින් මතු " බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.10.27 වන දින අංක 1466 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.11.24 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුලුව, මහනුවර ස්ථානයේ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මයා විසින් 2007.01.30 වන දින පෙ. ව. 11.00 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක් ලක්ෂ හැත්තෑඑක් දහස් තුන්සිය තුනයි ශත තිස්දෙක (රු. 171,303.32) මුදලක් වර්ෂ 2003.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ හතලිස් එක් දහසක (රු.141,000.00) මුදල ද, 2003.12.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්දහස් තුන්සිය තුනයි ශත තිස් දෙකක් (රු.30,303.32) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ හැත්තෑඑක් දහස් තුන්සිය තුනයි ශත තිස්දෙක (රු. 171,303.32) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ හතලිස් එක් දහසක (රු.141,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොලියක් 2004.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ කන්දපල්ල කෝරලේ ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාවේ රත්මල්ගල ග්‍රාමයේ රත්මල්ගල නැමැති ඉඩමට 2001.06.27 දින ඩබ්. ඩී. දසනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 5450 පිඹුර ප්‍රකාර ලොට් 2 ට මායිම්, උතුරට පැල ඉණි වැට ද, නැගෙනහිරට මාර්ග රක්ෂිතය සහ පාලුහොම්බාවේ සිට පට්ටිවෙලට ඇති පාර ද, දකුණට කම්බි සහ පැල ඉණි වැට ද, බටහිරට පිඹුරු අංක 5450 හි කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි අක්කර එකක් (අක්.1, රූඩ් 0, පර්.0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවයද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. ඩී. 88/195 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 28 වන දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

01-215

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0800000963.

ණයකරුගේ සම්පූර්ණ නම : නාඹටුන්න ගමචාරිගේ නුවණරත්න හෙවත් නුවණපාල

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.25 වැනි දින අංක 1457 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.12.27 වැනි දින "ලක්බිම", "තිනක්කුරල්" "ද අයිලන්ඩ්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, කුරුදුවත්ත, වල්ගම, මාතර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මහතා විසින් 2007.01.31 වැනි දින පෙ. ව. 10.30ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පහළොස්දහස් හතලිහයි ශත විසිපහක (රු. 2,15,040.25) මුදලක් වර්ෂ 2005.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්හතර දහස් හත්සීයක (රු. 1,34,700) මුදල ද, 2005.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූදහස් තුන්සිය හතලිහයි ශත විසිපහක (රු. 80,340.25) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පහළොස් දහස් හතලිහයි ශත විසිපහක (රු. 2,15,040.25) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්හතර දහස් හත්සීයක (රු. 1,34,700) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.90% බැගින් වන පොලියක් 2005.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

## උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ වෙල්ලබොඩ පත්තුවේ බෙලිදෙනිය පාතේගම ග්‍රාමයන්හි ගොඩැඩ පාරෙහි පිහිටි කරක්ගහවැව නමැති ඉඩමට 2000.10.27 දින ඒ. ඩී. පළිහක්කාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 5076 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : පහත පිට්ටෙන්නද, නැගෙනහිරට : ඉහළදෙණිය ද, දකුණට : පාතේගම සිට ගොඩැඩ පාරද, බටහිරට : කිරිමඩුවහේන ද යන මායිම් තුළ පිහිටි නවයයි දශම හයයි එකක් (අක්. 0, රූඩ් 0, පර්. 9.61) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 577/122 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-216

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2200000378.

ණයකරුගේ සම්පූර්ණ නම : අත්තනායක මුදියන්සේලාගේ සේනක අජිත් අත්තනායක

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.12.05 වැනි දින අංක 1318 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.12.10 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 48/1, කළුගල්පිටිය, බදුල්ල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් 2007.01.30 වැනි දින පෙ. ව. 11.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් තුන්සිය අනූනවයයි ශත හැට නවයක (රු. 2,45,399.69) මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූහත්දහස් තුන්සිය හතලිස් හතරයි ශත හැත්තෑදෙකක (රු. 1,97,344.72) මුදල ද, 2003.02.28 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් අටදහස් පනස්හතරයි ශත අනූහතක් (රු. 48,054.97) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් තුන්සිය අනූනවයයි ශත හැට නවයක (රු. 2,45,399.69) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූහත්දහස් තුන්සිය හතලිස් හතරයි ශත හැත්තෑදෙකක (රු. 1,97,344.72) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

## දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැගම් පත්තු කෝරළේ, වෙල්ලස්ස කොට්ඨාශයේ, බිබිල ප්‍රාදේශීය සභා සීමාවේ කෙහෙලත්තාවෙල ග්‍රාමයෙහි පිහිටි ඉත්තගොඩහේන නමැති ඉඩමට 1998.10.30 දින එච්. එම්. සමරනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 1509 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : ඒ. එම්. ඥාණසේකරට අයිති ඉඩමද, නැගෙනහිරට : මහා මාර්ගය දිගට ඇති රක්ෂිතයද, දකුණට : ඒ. එම්. සුදුබණ්ඩාගේ ඉඩමද, බටහිරට : එච්. එම්. හීන්බණ්ඩාගේ ඉඩමද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් තිස්තුනයි දශම හතරක් (අ. 0, රූ. 3, පර්. 33.4) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 5/403 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-217

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවරනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. පී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2003.07.03 දිනැති අංක 588 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කමල් නීල් සේනක සිදන්ත රත්වත්තේ ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සී/ස හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත ලත් බලය මත පහත සඳහන් දේපළ

පිහිටි ස්ථානයේ දී 2007.01.26 වැනි දින පෙ. ව. 10.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවගම් කෝරළේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, හෝකන්දර පිහිටි "වෙල්ලන්ගිරිය එස්ටේට්" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින්, මැන සාදන ලද 1999.11.08 දිනැති අංක 1657 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 32 දරන ඉඩම සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් ලියා සහතික කරන ලද 2003.07.03 වැනි දිනැති අංක 588 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර වන මාර්ග අයිතිය ද සමඟ වේ. විශාලත්වය පර්. 10.71.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.10.26 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ක් ද,
(2) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි) ක් ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක් ද,
(4) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් ද,
(5) විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
(6) විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2,000 ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල, වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් තොරතුරු.–සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, තිඹිරිගස්යාය ශාඛාව (දුරකථන අංක 4519862/2582606 හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

ආර්. එස්. එම්. ඔක්ෂන්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

රංජිත එස්. මහානාම
සාම විනිසුරු (මුළු දිවයිනට)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

දුරකථන අංකය : 2863121

01-218/1

**සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මාතලේ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - ආර්. එස්. එම්. ඔක්ෂන්ස්

සී/ස හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2007 ජනවාරි මස 29 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දැනට මාතලේ නැගෙනහිර රත්තොට නගර සභා සීමාව තුල මාතලේ නැගෙනහිර පල්ලෙ පත්තුවේ රත්තොට හොම්පොල්ල තැන්නේ පිහිටි වරිපනම් අංක 18 දරන කහටගහමුලවත්ත හෙවත් කහටගහමුලහේන නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. දොලොස්වැල විසින් 1966.10.10 වැනි දින සහ බලයලත් මානක ජේ. එම්. ජයසේකර විසින් 1968.04.01 වැනි දින සාදන ලද අංක 104 දරන උපබෙදුම ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඩී 1 සහ ලොට් සී දරන ඉඩම් කැබලි. විශාලත්වය - ලොට් ඩී 1-පර්චස් 3, ලොට් සී - පර්චස් 1.2, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද 2005.02.15 දින සහ අංක 601 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් කරීම් මොහොමඩ් රිසාර්ඩ් ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.11.18 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.11.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ක් ද,
(2) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි) ක් ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක් ද,
(4) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් ද,
(5) විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
(6) විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2,000 ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ, මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් තොරතුරු විමසන්න. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661815, 2661816

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

රංජිත එස්. මහානාම
සාම විනිසුරු (මුළු දිවයිනට)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

දුරකථන අංකය : 2863121

01-218/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.